NVQ චක්‍රලේඛ /2020

## තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

## ආබාධ සහිත අපේක්ෂකයන් සඳහා වන NVQ ඇගයීමෙහි සාධාරණ ගැලපීම් සිදු කිරීම

තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියට සහ ශ්‍රී ලංකාවේ සාන්තරාය පුද්ගලයන් සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව සැපයීම සම්බන්ධයෙන් වන ජාතික උපාය මාර්ගයන්ට අනුව ආබාධ සහිත පුද්ගලයන් යනු, නිපුණතා පුහුණු වෙත ඔවුන් සතු සීමිත ප්‍රවේශයන් හේතුවෙන් සහ සේවයෙහි නියුක්ත කරවීම යන දෘෂ්ටි කෝණයෙන් බැලීමේදී ඔවුන්ගේ සාර්ථකත්වය යන පදනම මත කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්‍රමවේදයෙහි විශේෂ අවධානය හිමිවිය යුතු සාන්තරාය මෙන්ම අවාසි සහගත තත්ත්වයන්හි පසුවන කණ්ඩායමක් ලෙස විශේෂයෙන් හඳුනා ගනු ලැබේ. ආබාධ සහිත පුද්ලගලයන් NVQ පුහුණු පාඨමාලාවන් සඳහා බඳවාගැනීම මේ වනවිටත් සීමා සහිතව සිදුවන අතර, ආබාධ සහිත පුද්ගලයන්ට සාධාරණ ගැලපීම් සපයනු නොලැබීමේදී, සහතික කරණයට අදාළව තම නිපුණතාවන් නිසි අයුරින් අගයනු ලැබීම සිදු නොවේ. ආබාධ සහිත පුද්ගලයන් යනු සමජාතීය කණ්ඩායමක් නොවන බැවින් ඔවුන්ගේ හැකියාවන් මත මිස ඔවුන්ගේ ආබාධ සහිත බව මත ඔවුන් ඇගයීම සිදු නොකල යුතු වේ.

ශිෂ්‍යයන්ගේ කාණ්ඩ ප්‍රවේශයන් සිදු කරන අවස්ථාවේදී තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය මත පදනම් වූ තොරතුරු පද්ධතියට ඔවුන් විසින් ඇතුළත් කරනු ලබන සිසුන්ගේ (එවැනි සිසුන් වේ නම්) ආබාධ සහිත භාවයේ ආකාරය සහ ස්වභාවය සඳහන් කිරීමට කටයුතු කරන මෙන් ජාතික වෘත්තීමය සුදුසුකම් දක්වා දිවෙන පිළිගත් පාඨමාලාවන් පවත්වනු ලබන ලියාපදිංචි පුහුණු සපයන්නන් වෙතින් මෙයින් ඉල්ලා සිටිනු ලැබේ. එම පුහුණු සපයන්නන් හට, තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් *ඇමුණුම් අංක I - ආබාධිතතා තොරතුරු වාර්තා කිරීමේ පෝරමය* භාවිතා කර ආබාධිතතාවන්ට අදළ තොරතුරු වාර්තා කොට ඇගයුම්කරුවන් සහ අනෙකුත් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පුද්ගලයන්ගේ භාවිතය උදෙසා පුහුණු මධ්‍යස්ථානයේ තැබිය හැකි අතර තවද එම පුහුණු සපයන්නන් හට *ඇමිණුම් අංක II - සාධාරණ ගැලපීම් ක්‍රියාත්මක කිරීම පිළිගැනීමේ පෝරමය* බාගත කළ හැකි අතර අවසන් ඇගයුමේදී පුරවා භාරදීම පිණිස ඇගයුම්කරුවන් හට එය ලබාදීමද සිදුකල හැක.

තෘතීයික හා වෘත්තීය කොමිෂන් සභාවේ ඇගයුම්කරු රෙජිස්ටරයේ වන ලියාපදිංචි ඇගයුම්කරුවන් හට 2020 ඔක්තෝබර් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම චක්‍රලේඛයේ අවශ්‍යතාවන්ට අනුගත වන ලෙස මෙයින් උපදෙස් දෙනු ලැබේ. ආබාධ සහිත සිසුන් ඇගයීමට ඇතුලත් වන්නේ නම් පූර්ව ඇගයීම් කාල සීමාව තුල ආයතනය සතු *ආබාධ සහිත බව පිළිබඳව තොරතුරු වාර්තා කිරීමේ පෝරමය* විමසීමට ඇගයුම්කරුට හැකියාව පවතී. අවසන් ඇගයුම සම්පූර්ණ කිරීමේදී අනෙකුත් වාර්තා සමඟ නිසිලෙස සම්පූර්ණ කරන ලද සාධාරණ ගැලපීම් ක්‍රියාත්මක කිරීම පිළිගැනීමේ පොරෝමය භාරදීම ඇගයුම්කරුවන් විසින් සිදු කළ යුතුය.



**A.D.R.T. Perera**
**BA ( English / Translation Methods)**
**Government Translator ( Sinhala/English) - Class I**
**Sworn Translator ( Sinhala/English)**
**District Court of Kandy**

ඇගයුම්කරුවන්, පුහුණු සපයන්නන් සහ තෘතීයික හා වෘත්තීයමය අධ්‍යාපන කොමිෂන් සභාව විශේෂයෙන්ම පහත භාවිතයන් අනුගමනය කළ යුතුය.

**1. දැනුම ඇගයීමට සිදු කෙරෙන සාධාරණ ගැලපීම්**

I. ලිඛිත විභාගය වෙනුවට වාචික ඇගයුමක්
II. ඇගයුම සම්පූර්ණ කිරීම සඳහා අමතර 25% ක අවම කාලයක්
III. ලියන්නකු / කියවන්නකු/ සංඥා භාෂා පරිවර්තකයකු / පුහුණුකරුවකු ගේ සහාය
IV. විකල්ප ආකෘතියකින් යුත් විභාග ප්‍රශ්න පත්‍රය
V. උපකාරක තාක්ෂණික මෙවලම් සහ හෝ ලිවීමේ ආධාරක භාවිතය
VI. ඇගයුම් ස්ථානය හෝ වනත් ස්ථානයක් සඳහා ප්‍රවේශවීමේ හැකියාව
VII. අධීක්ෂණයට යටත් විවේක කාලයක් (සෑම විනාඩි 40කටම විනාඩි 10ක විවේකයක්)
VIII. සරල සහ පහසු භාෂාවකින් සැකසුණු ප්‍රශ්න (ඥානන ආබාධ සහිත පුද්ගලයන් සඳහා),දෘශ්‍ය ආදානයන් අවශ්‍ය ප්‍රශ්න වෙනුවට යෙදීම සඳහා විකල්ප ප්‍රශ්න (දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා) හෝ විස්තරාත්මක ප්‍රශ්න (ශ්‍රවණාබාධිත පුද්ගලයන් සඳහා)

- තම ළමා අවධියෙහිදී අධ්‍යාපනය වෙත ප්‍රවේශය සීමා වීම සහ/හෝ චලන අපහසුතාවන් අත්විඳීම හේතුවෙන් ආබාධ සහිත පුද්ගලයන්ට ලිවීම හෝ යතුරු ලියනය කිරීම සිදුකළ නොහැකි වීමට ඉඩ ඇති අතර, එබැවින් වාචිකව පිළිතුරු සැපයීමට හෝ ලියන්නකුගේ/කියවන්නකුගේ සහාය ඇතිව පිළිතුරු සැපයීමට අවශ්‍ය වනු ඇත. ලේඛනයෙහි නිපුණතාව අදාළ වෘත්තියේ හරයට හෝ අදාළ නිපුණතා මට්ටම් සඳහා බලපෑමක් සිදු නොකරන අවස්ථාවන්හිදී මෙය සාධාරණ ගැලපීමකි.

**2. ප්‍රායෝගික (අවසන්) ඇගයුමට සිදු කල හැකි සාධාරණ ගැලපීම්.**

I. ඇගයුම සිදු කරන ස්ථානය වෙත ප්‍රවේශවීමේ පහසුව.
II. ඇගයුම සම්පූර්ණ කිරීම සඳහා අවම වශයෙන් 25% ක අමතර කාල සීමාවක්
III. විවිධ කාර්යයන් ඉටු කිරීමෙහි ලා විවිධ සන්නිවේදන මාධ්‍යයන් භාවිතය, සංඥා භාෂාව, තොල් කියවීම, ලිඛිත සටහන්, දෘශ්‍ය සංකේත, දෛහික සංඥා. (දෑස් ගැටුම, මුහුණත් ප්‍රකාශනය, හස්ත සංඥා) පැහැදිලි සහ සරල භාෂාවන් භාවිතා කිරීම, වර්ණ කේතයන් සඳහා යොමු යනාදිය.
IV. අදාළ කාර්යයන් ඉටු කිරීමේදී උපකාරක තාක්ෂණික මෙවලම් සහ/ හෝ අනුවර්තිත මෙවලම් භාවිතය.
V. කාර්යයන් ඉටු කිරීමේදී සාම්ප්‍රදායික නොවන/ වෙනස් ක්‍රමවේදයන් භාවිතය.

A.D.R.T. Perera
BA ( English / Translation Methods)
Government Translator ( Sinhala/English) - Class I
Sworn Translator ( Sinhala/English)
District Court of Kandy

VI. අදාළ ඇගයුම එයට සහභාගී වන්නන්ට සුපුරුදු පරිසරයක පැවැත්වීමට අවසර ලබාදීම. (උදාහරණ ලෙස පුහුණුව අතතුර භාවිතා කරන ලද මෙවලම් සහ උපකරණම ඇගයුමෙහිදීද භාවිතය)

සාධාරණ ගැලපීම් මගින් සිදු විය යුත්තේ යම් ආකාරයක ආබාධිතතාවක් සඳහා වර්ගීය වූ ප්‍රතිචාරයක් දක්වනු වෙනුවට පුද්ගලයන්ගේ අවශ්‍යතාවන් සැපිරීමයි. ඇගයීමක් අතරතුර යම් ආබාධ සහිත පුද්ගලයෙකු සඳහා නිවැරදිව ප්‍රතිචාර දැක්වූ දෙයක් එම ආබාධයම ඇති තවත් පුද්ගලයෙකු සඳහා නිවැරදිව ප්‍රතිචාර දක්වනු ඇතැයි අනුමාන කළ නොහැක.

NVQ ඇගයුම්කරුවන්ට සහාය වීම පිණිස, තෘතීයික සහ වෘත්තීයමය අධ්‍යාපන කොමිෂන් සභා වෙබ් අඩවියේ අන්තර්ගත කොට ඇති *ඇමිණුම් අංක III - ආබාධිතතාවන් අන්තර්ගත කරගැනීමේ මෙවලම මගින්* අදළ ආබාධිතතාවේ ස්වරූපයට අනුකූලව සිදු කළ හැකි සාධාරණ ගැලපීම් විධි ' පිළිබඳව විස්තරාත්මක තොරතුරු සැපයීම සිදු කරයි. සංචාරක කර්මාන්තයට අදාළ පුහුණු පාඨමාලාවන් වෙතින් වන උදාහරණයන්ගෙන් යෝජනා සන්නිදර්ශනය කරනු ලැබේ. මෙම උදාහරණයන් ආබාධ සහිත අපේක්ෂකයන්ගේ අවශ්‍යතා සැපිරීම පිණිස කවර හෝ NVQ පාඨමාලාවකට යෙදවීම සහ සාමාන්‍යකරණය කිරීම සිදු කළ හැකි බව විශ්වාස කෙරේ.

**3. සාධාරණ ගැලපීම් පිළිබඳව NVQ ඇගයුම්කරුවන් පුහුණු කරවීම:**

විවිධ ආකාරයේ ආබාධිතතාවන් සහිත අපේක්ෂකයන්ට අවශ්‍ය සාධාරණ ගැලපීම් වලට අදළව ඇගයුම්කරුවන් පුහුණු කිරීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහ වෘත්තීය හා තාක්ෂණ විශ්ව විද්‍යාලය මඟින් සිදු කරනු ඇත.

**4. NVQ ඇගයුම්කරුවන් පත් කිරීම:**

අදාළ පුහුණු සපයන්නන් විසින් ආබාධ සහිත අපේක්ෂකයන් ඇගයීම සිදු කිරීම සඳහා වන තම ඇගයුම් ඉල්ලීම් තෘතීයික සහ වෘත්තීයමය අධ්‍යාපන කොමිෂන් සභා වෙබ් අඩවියේ වන ස්වයංක්‍රීය ඇගයුම් කාර්ය සටහන් පද්ධතිය හරහා ඉදිරිපත් කළ යුතු වේ. තෘතියික සහ වෘත්තීය අධයාපන කොමිෂන් සභාව විසින් ඉන් අනතුරුව ඊ තැපැල ඔස්සේ සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත ඇගයුම්කරු මණ්ඩලය වෙත ඇගයුම්කරු පත්වීම් ලිපි යවනු ඇත. ඇගයුමෙහි ආබාධ සහිත සිසුවන් අන්තර්ගත නම් විශේෂ ඇගයුම්කරු පත්වීම් ලිපියක් නිකුත් කෙරෙනු ඇත.

**5. සාධාරණ ගැලපීම් සඳහා ඉල්ලීම් කිරීම:**

යම් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් විසින් , (VTC) පාඨමාලා ආරම්භක දිනයේ සිට නියමිත කාල සීමාව තුළ තෘතීයික හා වෘත්තීය අධයාපන කොමිෂන් සභාවේ මාර්ගගත පද්ධතිය වෙත තම ශිෂ්‍ය නාමලේඛනයන් උඩුගත කිරීම සිදු කරන විට, ආබාධ සහිත සිසුන් සිටී නම් එම සිසුන්ගේ ආබාධිතතා ස්වරූපයද ඇතුළත්ව ඒ පිළිබඳව විශේෂයෙන් සඳහන් කිරීම සිදු කළ යුතු වේ. මෙම වෘත්තීය පුහුණු

A.D.R.T. Perera
BA ( English / Translation Methods)
Government Translator ( Sinhala/English) - Class I
Sworn Translator ( Sinhala/English)
District Court of Kandy

මධ්‍යස්ථාන මගින්, ඇගයුම්කරුවන් සහ අනෙකුත් අදාළ පුද්ගලයන්ගේ විමර්ශනය සඳහා අදාළ ආබාධිතතාව පිළිබඳව සාක්ෂි (උදා: ආබාධිතතා සහතිකය, වෛද්‍ය වාර්තා, රජය වෙතින් අදාළ පුද්ගලයා ආබාධිතතා දීමනාව ලබා ගන්නා බව සනාථ කරන ලේඛන) පවත්වාගැනීම සහ අවශ්‍ය විට ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය.

යම් NVQ පාඨමාලාවක් තුළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සම්පිණ්ඩිත පරීක්ෂණයක් ලෙස පවත්වනු ලබන පොදු ලිඛිත පරීක්ෂණයක්/ සෙමෙස්ටරයක් (වර්ෂයක්) සහ විභාගයක් වේ නම්, අදාළ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය/ අධ්‍යයන ආයතනය විසින් තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ඇගයුම් අංශය වෙත අවසන් දිනයට ප්‍රථම අයදුම්පත් යොමු කිරීම සිදු කල යුතුය. ආබාධ සහිත අපේක්ෂකයන් සිටී නම් එවැනි එක් එක් අපේක්ෂකයෙක් සඳහා වෙන් වෙන් වශයෙන් සකසන ලද ඔවුන්ගේ අබාධිතතාවයේ ස්වරූපය ඇතුළත් සාධාරණ ගැලපීම් සඳහා වන ඉල්ලීම වෘත්තීයමය පුහුණු මධ්‍යස්ථානය/ අධ්‍යයන ආයතනය විසින් ඇගයුම් අංශය වෙත භාරදිය යුතුය.

**6. පූර්ව ඇගයුම් වීක්ෂණයන් (නිරීක්ෂණ චාරිකා)**

අ. ආබාධිතතාව පිළිබඳව සාක්ෂ්‍ය ලෙස ඉදිරිපත් කරනු ලබන ලේඛනයන්හි මුල් පිටපත් NVQ ඇගයුම්කරුවන් වෙත ඉදිරිපත් කරනු ඇත. වැඩිදුර තොරතුරු සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වෙතින් ලබාගතහැකි ආබාධිතතා දත්ත වාර්තා කිරීමේ පෝරමය භාවිතා කළ හැක.

ආ. NVQ ඇගයුම්කරුවන් විසින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ අදාළ කාර්ය මණ්ඩලය සහ අබාධිතතාවක් සහිත අපේක්ෂකයා සමඟ ඇගයුම අතරතුර සිදුකල යුතු වන සාධාරණ ගැලපීම් පිළිබඳව සාකච්ඡා කිරීම සහ තහවුරු කරගැනීම සිදු කරනු ඇත.

**7. නිපුණතා මත පදනම් ඇගයුම් සහ සම්පින්ඩිත /අවසාන ලිඛිත විභාග අතරතුර සාධාරණ ගැලපීම් සැපයීම.**

අ. විභාග මධ්‍යස්ථානයෙහි අධීක්ෂක/ඇගයුම්කරු විසින් හෝ අධීක්ෂක / ඇගයුම්කරු විසින් පත්කරනු ලබන පුද්ගලයෙකු විසින් ලිඛිත විභාගය අතරතුරදී, එක් එක් ආබාධ සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි සකසන ලද සාධාරණ ගැලපීම් භාවිතයෙහි යෙදවීම සිදුවන බවට තෘතීයික සහ වෘත්තීයමය අධ්‍යාපන කොමිෂන් සභාව තහවුරු කරගනු ඇත.

ආ. NVQ ඇගයුම්කරුවන් විසින් නිපුණතා පාදක ඇගයීම් (දැනුම සහ ප්‍රායෝගික කුසලතා යන අංශ දෙකම සඳහා වන) සිදු කරනු ලැබීමේදී සාධාරණ ගැලපීම් සපයනු ලබන බවට වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන / අධ්‍යයන ආයතන විසින් තහවුරු කරනු ඇත.

ඇ. NVQ ඇගයුම්රුවන් විසින් *සාධාරණ ගැලපීම් ක්‍රියාත්මක කිරීම පිළිගැනීමේ පෝරමය* අවසන් ඇගයුම් දිනයේදී සම්පූර්ණ කොට ඇගයුම් වාර්තා සහ අනෙකුත් අවශ්‍ය ලේඛන සමඟ වෘත්තීය



A.D.R.T. Perera
BA ( English / Translation Methods)
Government Translator ( Sinhala/English) - Class I
Sworn Translator ( Sinhala/English)
District Court of Kandy

පුහුණු මධ්‍යස්ථානය හරහා තෘතීයික යන වෘත්තීයමය අධ්‍යයන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

තෘතීයික සහ වෘත්තීයමය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ආබාධ සහිත අපේක්ෂකයන් ඇගයීම අතරතුර ක්‍රියාත්මක කරන ලද සාධාරණ ගැලපීම් වලට අදළව ලැබෙන එවැනි දත්ත, තෘතීයික සහ වෘත්තීයමය අධ්‍යයන තාක්ෂණ පද්ධතිය තුළ ආබාධිතතාව අන්තර්ගත කිරීමට අදාළව ප්‍රතිපත්ති ස්ථාපනයේදී සහ/ හෝ විමර්ශනයේදී සහ තීරණ ගැනීමේදී වැදගත් වනු ඇත.

මෙම චක්‍රලේඛය 2020 ඔක්තෝබර් මස 01 වනදා සිට බලාත්මක වනු ඇත.

ජානක ජයලත්

අධ්‍යක්ෂ ජනරාල් (වැ,බ)

තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව



A.D.R.T. Perera
BA ( English / Translation Methods)
Government Translator ( Sinhala/English) - Class I
Sworn Translator ( Sinhala/English)
District Court of Kandy

ඇමිණුම් 1 : ආබාධිතතා දත්ත වාර්තාකිරීමේ පෝරමය

| | |
|---|---|
| **අයදුම්කරුගේ නම :**<br><br>**ජාතික හැඳුනුම්පත් අංකය :** | **ආබාධිතතා ගණය :**❐ශ්‍රවණ ❐දෘශ්‍ය❐චලන<br>❐සංජානන ❐ස්වයං උවටැන ❐සන්නිවේදන ❐ වෙනත්<br>*කරුණාකර පැහැදිලි කරන්න :* ____________ |
| පාඨමාලා නාමය සහ එහි NVQ මට්ටම : | **පුහුණුව සපයන පුද්ගලයාගේ නම සහ සම්බන්ධ කරගැනීමේ තොරතුරු :** |

**අ. දැනුම් ඇගයුම - සාධාරණ ගැලපීමක් අයදුම් කිරීම**

ඔබ ඉල්ලා සිටින සාධාරණ ගැලපීම (ගැලපීම්) කවරේද? හැකිතාක් නිශ්චිත ලෙස සඳහන් කරන්න

ඔබට ඉටුකිරීමට අපහසුතාවක් ඇති කාර්යය (කාර්යයන්) මොනවාද? අයදුම් කරන ලද ගැලපීම (ගැලපීම්) ඔබට සහාය වනු ඇත්තේ කෙසේද?

**ආ. ප්‍රායෝගික ඇගයුම - සාධාරණ යථාවත් කිරීමක් අයදුම් කිරීම**

ඔබ අයදුම් කරන නිශ්චිත ගැලපීම (ගැලපීම්) මොනවාද? හැකිතරම් නිශ්චිතව දක්වන්න.

**A.D.R.T. Perera**
**BA ( English / Translation Methods)**
**Government Translator ( Sinhala/English) - Class I**
**Sworn Translator ( Sinhala/English)**
**District Court of Kandy**

| |
|---|
| ඔබට ඉටුකිරීමට අපහසුතාවක් ඇති කාර්‍යය (කාර්‍යයන්) මොනවාද? අයදුම් කරන ලද ගැලපීම (ගැලපීම්) ඔබට සහාය වනු ඇත්තේ කෙසේද? |
| **ඇ. වෙනත්** |
| ඔබගේ ගැලපීම (ගැලපීම්) සඳහා වන අයැදුම සැකසීමේදී ප්‍රයෝජනවත් වනු ඇති අමතර තොරතුරු කිසිවක් වේ නම් කරුණාකර එම තොරතුරු සැපයීම සිදුකරන්න. (ආබාධිතතාව පිළිබඳව සාක්ෂ්‍ය ලෙස සුදුසු ලේඛණ අමුණන්න උදා: ආබාධිතතා සහතිකය, වෛද්‍ය වාර්තාව, අදාළ පුද්ගලයා රජය වෙතින් සැපයෙන ආබාධිතතා දීමනාව ලබාගන්නා බව පෙන්වාදෙන ලේඛණ. කවර හෝ ස්ථානයකදී වෛද්‍ය බලධරයෙකු විසින් නිකුත්කරනු ලැබූ ආබාධිතතා සහතිකයක් වේ නම් එය සැමතැනකම පිළිගනු ලබන බවට දැනුවත් වන්න.) |
| **ඈ. අත්සන්** |

| | |
|---|---|
| අපේක්ෂකයා: | දිනය : |
| පුහුණු සපයන්නා නියෝජිත: | දිනය : |

A.D.R.T. Perera
BA ( English / Translation Methods)
Government Translator ( Sinhala/English) - Class I
Sworn Translator ( Sinhala/English)
District Court of Kandy

ඇමිණුම 2 : සාධාරණ ගැලපීම් ක්‍රියාත්මක කිරීම - පිළිගැනීමේ පෝරමය

| | |
|---|---|
| අපේක්ෂකයාගේ නම :<br><br>හැඳුනුම්පත් අංකය: | ආබාධිතතා ගණය :❒ශ්‍රවණ ❒දෘශ්‍ය❒චලන<br>❒සංජානන ❒ස්වයං උවටැන ❒සන්නිවේදන ❒ වෙනත්<br>*කරුණාකර පැහැදිලි කරන්න :* ____________ |
| පාඨමාලා නාමය සහ එහි NVQ මට්ටම : | පුහුණුව සපයන පුද්ගලයාගේ නම සහ සම්බන්ධ කරගැනීමේ තොරතුරු : |
| NVQ ඇගයුම්කරුගේ නම : | NVQ ඇගයුම්කරුගේ ලියාපදිංචි අංකය : |

**අ. දැනුම් ඇගයුම - සපයන ලද සාධාරණ ගැලපීම (ගැලපීම්)**

ඇගයුම අතරතුර ඔබ විසින් අපේක්ෂකයා හට කවර හෝ ගැලපීමක් සපයනු ලැබුවාද? ඔව් ❒ නැත ❒

- පිළිතුර නැත නම් , කරුණාකර හේතුව පැහැදිලි කරන්න
- පිළිතුර ඔව් නම්, ඔබ විසින් සපයන ලද ගැලපීම් කවරේද?

අපේක්ෂකයාට ඉටුකිරීමට අපහසුතාවක් පැවති කාර්යය (කාර්යයන්) මොනවාද? එම ගැලපීම (ගැලපීම්) අපේක්ෂකයාට සහාය වූයේ කෙසේද?

**ආ. ප්‍රායෝගික ඇගයුම - සපයන ලද සාධාරණ ගැලපීම්**

ඇගයුම අතරතුර ඔබ විසින් අපේක්ෂකයාට කවර හෝ ගැලපීමක් සපයනු ලැබුවාද? ඔව් ❒ නැත ❒

- පිළිතුර නැත නම් , කරුණාකර හේතුව පැහැදිලි කරන්න
- පිළිතුර ඔව් නම්, ඔබ විසින් සපයන ලද ගැලපීම (ගැලපීම්) කවරේද?

A.D.R.T. Perera
BA ( English / Translation Methods)
Government Translator ( Sinhala/English) - Class I
Sworn Translator ( Sinhala/English)
District Court of Kandy

| |
|---|
| අපේක්ෂකයාට ඉටුකිරීමට අපහසුතාවක් පැවති කාර්‍යය (කාර්‍යයන්) මොනවාද? එම ගැලපීම (ගැලපීම්) අපේක්ෂකයාට සහාය වූයේ කෙසේද? |
| **ඇ. වෙනත්** |
| මෙම පෝරමයෙහි ඇතුළත් විය යුතු යයි ඔබ සිතන කවර හෝ අමතර තොරතුරක් වේ නම් එය සපයන්න : |
| **ඇ. අත්සන්** |

| | |
|---|---|
| අපේක්ෂක : | දිනය : |
| NVQ ඇගයුම්කරු 1 : | දිනය : |
| NVQ ඇගයුම්කරු 2 : | දිනය : |
| පුහුණු සැපයුම්කරුගේ නියෝජිත : | දිනය : |

A.D.R.T. Perera
BA ( English / Translation Methods)
Government Translator ( Sinhala/English) - Class I
Sworn Translator ( Sinhala/English)
District Court of Kandy

02 / 10 / 2020